# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1653/19 - 2010 මැයි 12 වැනි බදාදා - 2010.05.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 12/2008.

**2007 අංක 54 දරන ඖෂධවලට ඇබ්බැහි තැනැත්තන් (ප්‍රතිකාර හා පුනරුත්ථාපනය) පිළිබඳ පනත**

2 වන වගන්තිය යටතේ නියමය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන ව්‍යවස්ථාවේ 2 වන ඡේදය සමග කියවිය යුතු, 2007 අංක 54 දරන ඖෂධවලට ඇබ්බැහි තැනැත්තන් (ප්‍රතිකාර හා පුනරුත්ථාපනය) පිළිබඳ පනතේ 2 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති මහින්ද රාජපක්ෂ වන මා විසින්, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ නිර්දේශය මත, මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ස්ථාන ඖෂධවලට ඇබ්බැහි වූ තැනැත්තන් රැකබලා ගැනීම හා පුනරුත්ථාපනය සඳහා වූ මධ්‍යස්ථාන වශයෙන් නම් කරමි.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති.

2010 මැයි මස 04 වැනි දින,
කොළඹ දී ය.

*උපලේඛනය*

*ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථාන*

1. පල්ලේකැලේ
2. වටරැක
3. තල්දෙන
4. වීරවිල
5. අනුරාධපුර
6. පල්ලන්සේන
7. කන්දවත්ත
8. මීතිරිගල

05-677/1

1A - G 012848—380 (2010/05)

එල්. ඩී. බී. 12/2008.

**2007 අංක 54 දරන ඖෂධවලට ඇබ්බැහි තැනැත්තන් (ප්‍රතිකාර හා පුනරුත්ථාපනය) පිළිබඳ පනත**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන ව්‍යවස්ථාවේ (2) වන ඡේදය සමග කියවිය යුතු, 2007 අංක 54 දරන ඖෂධවලට ඇබ්බැහි තැනැත්තන් (ප්‍රතිකාර හා පුනරුත්ථාපනය) පිළිබඳ පනතේ 3 වන වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදනු ලබන නියෝග.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති.

2010 මැයි මස 04 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මෙම නියෝග, 2010 අංක 01 දරන ඖෂධවලට ඇබ්බැහි තැනැත්තන් (පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථාන බලපත්‍ර) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. යම් තැනැත්තකු විසින්, ඖෂධවලට ඇබ්බැහි වූ තැනැත්තන් රැකබලා ගැනීම හා පුනරුත්ථාපනය කිරීමේ කාර්ය සඳහා, මේ නියෝග ප්‍රකාර බලපත්‍රයක් ලබාගෙන ඇත්නම්, එවැනි තැනැත්තකු මිස වෙනත් කිසිම තැනැත්තකු විසින් එම කාර්ය සඳහා පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථානයක් පිහිටුවීම සිදු නොකළ යුතු ය.

3. ඖෂධවලට ඇබ්බැහි වූ තැනැත්තන් රැකබලා ගැනීම සහ පුනරුත්ථාපනය සඳහා පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථානයක් පිහිටුවීමට අදහස් කරන යම් තැනැත්තකු විසින් (මෙහි මින්මතු "NDDCB" යනුවෙන් දක්වනු ලබන) අන්තරායකර ඖෂධ පාලන ජාතික මණ්ඩලය වෙත මෙහි 1 වන උපලේඛනයේ පෝරම අංක 1 හි දක්වා ඇති ආකෘතියෙහි වූ ඉල්ලුම්පත්‍රයක් රුපියල් එක්දහසක ඉල්ලුම්පත්‍ර ගාස්තුවක් ද සමඟ ලිඛිතව ඉදිරිපත් කළ යුතු ය.

එසේ වුව ද, මෙම නියෝග ක්‍රියාත්මක වීමට පෙරාතුව, ඖෂධවලට ඇබ්බැහි වූ තැනැත්තන් රැකබලා ගැනීම සහ පුනරුත්ථාපනය සඳහා දැනටමත් පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථානයක් පිහිටුවා ඇති යම් තැනැත්තකු, මෙම නියෝග ක්‍රියාත්මක වන දින සිට මාස හයක් ඇතුළත, දැනටමත් පවතින්නා වූ එම පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථානය නොකඩවා පවත්වාගෙන යාම සඳහා "NDDCB" වෙත ලිඛිතව මෙහි 1 වන උපලේඛනයේ පෝරම අංක 01 හි දක්වා ඇති ආකෘතියේ වූ ඉල්ලුම් පත්‍රයක් රුපියල් එක් දහසක ඉල්ලුම්පත්‍ර ගාස්තුවක් ද සමඟ ඉදිරිපත් කළ යුතු ය.

4. (1) ඉල්ලුම් පත්‍රයක් ලැබුණු දින සිට මාසයක් ඇතුළත, ඉල්ලුම්කරු විසින් ඉල්ලුම් පත්‍රයේ දක්වා ඇති අවශ්‍යතා සම්පූර්ණ කර ඇති බවට "NDDCB" සෑහීමට පත් වූ පසු ඉල්ලුම්කරු විසින් රුපියල් පන්දහසක බලපත්‍ර ගාස්තුව ගෙවූ පසු, ඉල්ලුම් පත්‍රයේ නිශ්චිතව සඳහන් කොට ඇති ස්ථානය පුද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථානයක් ලෙස නියම කරමින් ඉල්ලුම්කරුට බලපත්‍රයක් නිකුත් කළ හැකි ය.

(2) මෙම නියෝගය යටතේ නිකුත් කරනු ලබන බලපත්‍රයක්, එය නිකුත් කරනු ලබන දින සිට අවුරුදු දෙකක කාලයක් සඳහා වලංගු විය යුතු ය. මෙම නියෝගය යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක බලපත්‍රලාභියකු, එම බලපත්‍රයේ කල් ඉකුත් වන දිනට මාසයකට පෙර, සෑම වසර දෙකකට වරක් එම බලපත්‍රය අලුත් කිරීම සඳහා මෙහි 1 වන උපලේඛනයේ 2 වන පෝරමයේ දක්වා ඇති ආකෘතියෙහි වූ ඉල්ලුම්පත්‍රයක් NDDCB වෙත ලිඛිතව ඉදිරිපත් කළ යුතු ය.

(3) මෙම නියෝගය යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් අලුත් කිරීම සඳහා වන සෑම ඉල්ලුම්පත්‍රයක් ම රුපියල් පන්සියයක ගාස්තුව ද සමඟ ඉදිරිපත් කළ යුතු ය.

(4) NDDCB විසින්, බලපත්‍රයක් අලුත් කිරීම සඳහා බලපත්‍රලාභියකු විසින් ඉදිරිපත් කරනු ලබන ඉල්ලුම් පත්‍රයක සඳහන් තොරතුරු සම්බන්ධයෙන් සෑහීමට පත් වූ පසු සහ ඉල්ලුම්කරු විසින් රුපියල් දෙදහසක් වන බලපත්‍ර අළුත් කිරීමේ ගාස්තුව ගෙවූ පසු එම ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කළ දින සිට මාසයක් ඇතුළත, තවත් අවුරුදු දෙකක කාලයක් සඳහා එම බලපත්‍රය අලුත් කළ හැකි ය.

5. (1) 4 වන නියෝගය යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් NDDCB මගින් පහත සඳහන් කරුණු මත අවලංගු කළ හැකි ය:-

(අ) එම බලපත්‍රය නිකුත් කරනු ලැබ ඇත්තේ කවර කොන්දේසිවලට යටත්ව ද, බලපත්‍රලාභියා විසින් එම යම් කොන්දේසියක් කඩකිරීම; හෝ

(ආ) මේ නියෝග යටතේ බලපත්‍රයක් ලබා ගැනීම සඳහා වූ ඉල්ලුම් පත්‍රයක සපයා ඇති තොරතුරු සාවද්‍ය සහ වැරදි බව දැනගන්නට ලැබීම.

(2) NDDCB මගින්, 4 වන නියෝගය යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් අවලංගු කිරීමට පෙර එම බලපත්‍රය අවලංගු නොකළ යුතුතේ මන්දැයි හේතු දැක්වීම සඳහා බලපත්‍රලාභියාට අවස්ථාවක් ලබා දීමට හැකි ය. මේ නියෝගය යටතේ යම් බලපත්‍රයක් අවලංගු කිරීම පිළිබඳව බලපත්‍රලාභියාට දැනුම් දිය යුතු ය.

එසේ වුව ද, මේ නියෝගය යටතේ බලපත්‍රයක් අවලංගු කරනු ලබන්නේ කවර තැනැත්තකුගේ ද, ඒ තැනැත්තා විසින්, එසේ බලපත්‍රය අවලංගු කිරීම සඳහා හේතු වූ කඩ කිරීම නිවැරදි කරගෙන ඇති බවට NDDCB සෑහීමට පත් වන ලෙස ඔප්පු කරන්නේ නම්, එම අවලංගු කිරීමේ දින සිට අවුරුද්දක කාලයකට පසු, අලුත් බලපත්‍රයක් සඳහා ඉල්ලීමක් කළ හැකි ය.

## I වන උපලේඛනය

### පෝරම අංක 1

වෙත -
ජාතික අන්තරායදායක ඖෂධ පාලක මණ්ඩලය,
අංකඃ 383, කෝට්ටේ පාර,
රාජගිරිය.

**2007 අංක 54 දරන ඖෂධවලට ඇබ්බැහි තැනැත්තන් (ප්‍රතිකාර හා පුනරුත්ථාපනය) පිළිබඳ පනත බලපත්‍රයක් ලබා ගැනීම සඳහා ඉල්ලුම්පත්‍රය**

**ඉල්ලුම්කරුගේ විස්තර**

1. ඉල්ලුම්කරුගේ නම : ------------------------------------------------------------------------------------

------------------------------------------------------------------------------------

2. ඉල්ලුම්කරුගේ ලිපිනය : ------------------------------------------------------------------------------------

------------------------------------------------------------------------------------

------------------------------------------------------------------------------------

3. ජා.හැ.ප. අංකය : ------------------------------------------------------------------------------------

ව්‍යාපාර ලියාපදිංචි අංකය/N(Pvc) අංකය : ------------------------------------------------------------------------------------

4. දුරකථන අංකය : --------------------------------------------

5. ෆැක්ස් අංකය : --------------------------------------------

6. ඊ-තැපැල : --------------------------------------------

7. ප්‍රතිකාර මධ්‍යස්ථානයේ ලිපිනය : ------------------------------------------------------------------------------------

------------------------------------------------------------------------------------

------------------------------------------------------------------------------------

8. නවාතැන් ලබා දිය හැකි උපරිම සේවාදායකයන් සංඛ්‍යාව

9. ප්‍රතිකාර මධ්‍යස්ථානය සඳහා පාවිච්චි කරනු ලබන ඉඩමේ භූමි ප්‍රමාණය අක් රූඩ් පර්

10. පහත සඳහන් දෑ සම්පූර්ණ කොට ඇත්නම් “ √ ” යන සළකුණ හෝ එසේ නොවේ නම් “X” යන සළකුණ දී ඇති කොටුවේ දක්වන්න.

10.1 ගොඩනැගිල්ල, ඉඩමෙන් 70% ට නොඅඩු ප්‍රමාණයක් තිබිය යුතු ය.

10.2 ක්‍රීඩා සහ විනෝදාංශ සඳහා වන ඉඩ ප්‍රමාණය ඉඩමෙන් 20% ක් විය යුතු ය.

10.3 ගෙවත්තේ ඉඩ ප්‍රමාණය ඉඩමෙන් 10% ක් විය යුතු ය.

10.4 විදුලිය

10.5 ජල සැපයුම

10.6 යෝග්‍ය කාණු පද්ධතිය

10.7 වෙන වෙනම ගැහැණු සහ පිරිමි සඳහා නිදන ශාලා

10.8 මුළුතැන් ගෙය සඳහා වෙනම ස්ථානයක්

10.9 වැසිකිළි සහ නාන කාමර, තැනැත්තන් අට දෙනෙකුට නොවැඩි ගණනකට එක් වැසිකිළියක් සහ නාන කාමරයක් බැගින්

10.10 ආහාර අනුභවය සඳහා වෙනම ස්ථාන

10.11 කණ්ඩායම් සැසිවාර, රැස්වීම්, සම්මන්ත්‍රණ සහ වැඩමුළු සඳහා වෙනම ස්ථාන

10.12 පුද්ගලික හෝ කණ්ඩායම් උපදේශනය සඳහා වෙනම ස්ථාන

10.13 ප්‍රතිකාර මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂවරයාගේ කාර්යාලය සඳහා වෙනම කාමරයක්

10.14 අනෙකුත් කාර්ය මණ්ඩලවලට කාර්යාල ඉඩ පහසුකම්

10.15 කාර්යාල මණ්ඩල සඳහා නේවාසික පහසුකම්

10.16 යෝග්‍ය ගබඩා කාමර

10.17 ඇඳක් සඳහා අවම වශයෙන් වර්ග මීටර 2 බැගින් ඉඩ ප්‍රමාණයක්

10.18 සෙ.මී. 70 ට වඩා පටු නොවන ඇඳන්

10.19 තැනැත්තකුට අවම වශයෙන් එක් ලොකරය බැගින්

10.20 කෑම මේස සහ පුටු

10.21 කාර්යාල ලී බඩු

10.22 ශීතකරණ

10.23 ඉයුම් පිහුම් සහ කෑම සඳහා භාජන

10.24 රූපවාහිනී/ගුවන් විදුලි යන්ත්‍ර

10.25 සාමාන්‍ය ඇඳ ඇතිරිලි

10.26 කාර්යාල ලිපිද්‍රව්‍ය

10.27 කියවීම් ද්‍රව්‍ය

10.28 සේවාවන් සඳහා වාහනයක්

10.29 සාමාන්‍ය ගෙවත්තක් සහ එය පවත්වාගෙන යෑමට අවශ්‍ය ආයුධ

11. පහත සඳහන් තනතුරු සඳහා ප්‍රතිකාර මධ්‍යස්ථානයේ නිලධරයන් සිටී ද යන්න සහ සිටින නිලධරයන් සංඛ්‍යාව දී ඇති කොටු තුළ ලකුණු කරන්න.

නිදා: උපදේශක √ 2

අධ්‍යක්ෂ
උපදේශක
සහකාර උපදේශක
උපදේශක සහකරුවන්
සාත්තු සේවිකා
වෘත්තීය උපදේශක

12. කාර්ය මණ්ඩලයේ සුදුසුකම් : නිලධරයන්ට දී ඇති සුදුසුකම් තිබේ නම් අදාළ කොටුවේ " √ " ලකුණු කරන්න.

12.1 ප්‍රතිකාර මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂවරයා

කළමනාකරන ක්ෂේත්‍රයේ වසර පහක පළපුරුද්දක් සහ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් පිළිගත් විශ්ව විද්‍යාලයක සමාජ විද්‍යා/කළමනාකරණ උපාධියක්

පරිපාලන සහ ප්‍රතිකාර වැඩසටහන් කළමනාකරන සම්බන්ධයෙන් වසර 8 ක පළපුරුද්දක් සහ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් විශ්ව විද්‍යාලයක මත්ද්‍රව්‍ය දුර්භාවිතය කළමනාකරන අධ්‍යයන ඩිප්ලෝමාවක්

අ.පො.ස. (උ.පෙ.) විෂයයන් තුනක් එක්වර සමත්වීම සහ පරිපාලන සහ ප්‍රතිකාර වැඩසටහන් කළමනාකරණය පිළිබඳ වසර දහයක පළපුරුද්ද

ගණිතය, සිංහල සහ ඉංග්‍රීසි යන විෂයයන් ද ඇතුළුව අ.පො.ස. (සා.පෙ.) විෂයයන් හයක් එක්වර සමත්වීම සහ පරිපාලන සහ ප්‍රතිකාර වැඩසටහන් කළමනාකරණය පිළිබඳ වසර පහළොවක පළපුරුද්ද

12.2 උපදේශක

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් විශ්ව විද්‍යාලයක සමාජ විද්‍යාව පිළිබඳ උපාධියක් සහ උපදේශන සේවාව පිළිබඳ වසර තුනක පළපුරුද්ද

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් විශ්ව විද්‍යාලයක ඖෂධ අනිසි ලෙස භාවිතය කළමනාකරණය කිරීමේ අධ්‍යයන අංශයේ ඩිප්ලෝමාවක් සහ උපදේශන සේවයේ වසර පහක පළපුරුද්ද

සමාජ සේවා කටයුතු ඩිප්ලෝමාවක් සහ උපදේශන සේවයේ වසර අටක පළපුරුද්ද

අ.පො.ස. (උ.පෙ.) විෂයයන් තුනක් එක්වර සමත්වීම සහ උපදේශන සේවයේ වසර දහයක පළපුරුද්ද ☐

ගණිතය, සිංහල සහ ඉංග්‍රීසි යන විෂයයන් සඳහා සම්මාන සාමාර්ථයන් ඇතුළුව අ.පො.ස (සා.පෙ) විෂයයන් හයක් එක්වර සමත් වීම සහ උපදේශන සේවයේ වසර පහළොවක පළපුරුද්ද ☐

12.3 සහකාර උපදේශක

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් විශ්ව විද්‍යාලයක සමාජ විද්‍යාව පිළිබඳ උපාධියක් සහ උපදේශන සේවාව පිළිබඳ වසර එකක පළපුරුද්ද ☐

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් විශ්ව විද්‍යාලයක ඖෂධ අනිසි ලෙස පාවිච්චිය කළමනාකරණය කිරීම පිළිබඳ අධ්‍යයන අංශයේ ඩිප්ලෝමාවක් සහ මත්ද්‍රව්‍ය ප්‍රතිකාර ක්ෂේත්‍රයේ වසර තුනක පළපුරුද්ද ☐

සමාජ සේවා කටයුතු ඩිප්ලෝමාවක් සහ මත්ද්‍රව්‍ය ප්‍රතිකාර ක්ෂේත්‍රයේ වසර පහක පළපුරුද්ද ☐

අ.පො.ස. (උ.පෙ.) විෂයයන් තුනක් එක්වර සමත්වීම සහ මත්ද්‍රව්‍ය ප්‍රතිකාර ක්ෂේත්‍රයේ වසර අටක පළපුරුද්ද ☐

ගණිතය, සිංහල සහ ඉංග්‍රීසි යන විෂයයන් සඳහා සම්මාන සාමාර්ථයන් ඇතුළුව අ.පො.ස (සා.පෙ) විෂයයන් හයක් එක්වර සමත් වීම සහ මත්ද්‍රව්‍ය ප්‍රතිකාර ක්ෂේත්‍රයේ වසර දහයක පළපුරුද්ද ☐

12.4 උපදේශන සහකාර

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් ඖෂධ අනිසි ලෙස පාවිච්චිය කළමනාකරණය කිරීම පිළිබඳ අධ්‍යයන අංශයේ ඩිප්ලෝමාවක් සහ මත්ද්‍රව්‍ය ප්‍රතිකාර ක්ෂේත්‍රයේ වසර එකක පළපුරුද්ද ☐

සමාජ සේවා කටයුතු ඩිප්ලෝමාවක් සහ මත්ද්‍රව්‍ය ප්‍රතිකාර ක්ෂේත්‍රයේ වසර තුනක පළපුරුද්ද ☐

අ.පො.ස. (උ.පෙ.) විෂයයන් තුනක් එක්වර සමත්වීම සහ මත්ද්‍රව්‍ය ප්‍රතිකාර ක්ෂේත්‍රයේ වසර පහක පළපුරුද්ද ☐

ගණිතය, සිංහල සහ ඉංග්‍රීසි යන විෂයයන් සඳහා සම්මාන සාමාර්ථයන් ඇතුළුව අ.පො.ස (සා.පෙ) විෂයයන් අටක් එක්වර සමත් වීම සහ මත්ද්‍රව්‍ය ප්‍රතිකාර ක්ෂේත්‍රයේ වසර අටක පළපුරුද්ද ☐

12.5 සාත්තු සේවක/සේවිකාවන්

ගණිතය, සිංහල සහ ඉංග්‍රීසි යන විෂයයන් සඳහා සම්මාන සාමාර්ථයන් ඇතුළුව අ.පො.ස (සා.පෙ) විභාගයේ විෂයයන් හයක් එක්වර සමත් වීම ☐

රජයේ පිළිගත් ආයතනයක සාත්තු සේවක සහතිකයක් ☐

රජයේ සාත්තු සේවයේ වසර දෙකක පළපුරුද්ද ☐

12.6 වෘත්තීය උපදේශක

ගණිතය, සිංහල සහ ඉංග්‍රීසි යන විෂයයන් සඳහා සම්මාන සාමාර්ථ ඇතුළුව අ.පො.ස (සා.පෙ) විෂයයන් හයක් එක්වර සමත් වීම
වෘත්තීය පුහුණුව පිළිබඳ පිළිගත් ආයතනයක් නිකුත් කළ සහතිකයක්
අදාළ ක්ෂේත්‍රයේ වසර දෙකක පළපුරුද්ද

13. ප්‍රතිකාර මධ්‍යස්ථානයේ අනුගමනය කරනු ලබන හෝ අනුගමනය කරනු ලැබීමට අදහස් කරන ප්‍රතිකාර ක්‍රමවේද මොනවාද යන්න. වෙනත් යම් ක්‍රමවේදයක් භාවිත කරන්නේ නම් සඳහන් කරන්න.

- මනෝ විද්‍යාත්මක ආකෘතිය ☐
- ප්‍රතිකාරාත්මක ප්‍රජා ආකෘතිය ☐
- බහු විධ ආකෘතිය ☐
- ආගමික විශ්වාස මත පදනම් වූ ප්‍රතිකාර ආකෘතිය ☐
- ජීව භෞතික ආකෘතිය ☐
- සම්ප්‍රදායානුකූල ආකෘතිය ☐
- .............................................. ☐
- .............................................. ☐

14. ප්‍රතිකාර මධ්‍යස්ථානයේ දී සේවාදායකයන්ට පහත සඳහන් සේවා සපයනු ලබන්නේ නම් හෝ සපයනු ලැබීමට නියමිත නම් අදාළ කොටුවේ " √ " යන සළකුණු යොදන්න.

14.1 වෛද්‍ය/සායන
සේවාදායකයාගේ ශාරීරික සහ මානසික තත්ත්වය නිශ්චය කිරීමට හැකි වන පරිදි අවශ්‍ය අවස්ථාවල වෛද්‍ය/මනෝ වෛද්‍ය වෘත්තිකයකුගේ සේවය ලබාදීම ☐

14.2 පෝෂණය
සේවාදායකයාගේ අවශ්‍යතා අනුව සැලසුම් කළ ආහාර වේලක් ☐

14.3 HIV, Hep. B/C සහ STD
ඉහත රෝග සඳහා සේවාදායකයා පරීක්ෂා කිරීම හා අවශ්‍ය පියවර ගැනීම ☐

14.4 අධ්‍යාත්මික
ආගමික අධ්‍යාපනයක් ලබාදීම සහ පුහුණු කිරීමට සේවාදායකයා දිරිමත් කිරීම ☐

14.5 පවුල් සේවාවන්
පවුල් උපදේශන සේවාවන් සැපයීම ☐

14.6 පෙර තිබූ රෝගී තත්ත්වය නැවත ඇති වීම වැළැක්වීම
ඖෂධ භාවිතය සඳහා යොමු විය හැකි දැඩි අවදානම් සහිත තත්ත්ව සහ උත්තේජිත අවස්ථා හඳුනාගැනීම සඳහා සේවාදායකයන්ට ඉගැන්වීම ☐

14.7 පසු සත්කාර
පසු සත්කාර වැඩසටහන් පැවැත්වීම ☐

14.8 උපදේශනය
පුද්ගලික සහ කණ්ඩායම් උපදේශනය ☐

14.9 නීති උපදේශනය
සේවාදායකයාගේ ඖෂධ දුර්භාවිතය නිසා වූ නීතිමය ගැටලු සහ අවශ්‍යතා සම්බන්ධයෙන් ☐

14.10 වෘත්තීය සහාය
සේවාදායකයාට සමාජශීලී සහ රැකියාවල නියුතු වීමට අවශ්‍ය නිපුණතා සැලසීම ☐

14.11 ජීවන කුශලතා පුහුණුව
ප්‍රධාන ජීවන නිපුණතා වර්ධනය ☐

14.12 අධ්‍යාපනය සහ තොරතුරු
ජීවිතයට අවශ්‍ය මූලික අධ්‍යාපනය ☐

15. පහත කරුණු සම්බන්ධයෙන් ලේඛන/වාර්තා පවත්වාගෙන යන්නේ නම් " √ " යන සළකුණ යොදන්න.

- ඇතුළත්වීම ☐
- ප්‍රතිකාර සම්පූර්ණ නොකරන තැනැත්තන් ☐

| | |
|---|---|
| ප්‍රතිකාර සම්පූර්ණ කළ බව | ☐ |
| ඖෂධවලින් බැහැර බව | ☐ |
| ඒ ඒ පුද්ගලයා සඳහා තත්‍ය අධ්‍යයනය | ☐ |
| ප්‍රතිකාර කරන ලද මුළු ගණන | ☐ |

16. ප්‍රතිකාර මධ්‍යස්ථානයේ ප්‍රතිකාර කරනු ලබන කාර්ය මණ්ඩලය සහ පරිපාලන කාර්ය මණ්ඩලය හැර සේවයේ නියුක්ත කොට ඇති අනෙකුත් තැනැත්තන් සිටී නම්, ඔවුන්ගේ තනතුරු සහ සේවක සංඛ්‍යාව

| *තනතුර* | *සංඛ්‍යාව* |
|---|---|
| ........................................................................................................ | ☐ |
| ........................................................................................................ | ☐ |
| ........................................................................................................ | ☐ |
| ........................................................................................................ | ☐ |
| ........................................................................................................ | ☐ |
| ........................................................................................................ | ☐ |

17. *(අ)* බලපත්‍රයක් ලබාගැනීම සඳහා මීට පෙර ඉල්ලුම්කර ඇත්තේ ද?
*(ආ)* ඉල්ලුම්පත්‍රය ප්‍රතික්ෂේප කරන ලද්දේ ද ?
*(ඇ)* ඉහත ප්‍රශ්නයට "ඔව්" යන්නෙන් පිළිතුරු සපයා ඇත්නම්, කවර වතාවක් එසේ ප්‍රතික්ෂේප කරන ලද්දේ ද යන්න සහ එසේ කිරීමට හේතු ?

........................................................................................................
........................................................................................................
........................................................................................................
........................................................................................................

18. *(අ)* ප්‍රතිකාර මධ්‍යස්ථානය සඳහා නිකුත් කරන ලද බලපත්‍රයක් NDDCB මගින් යම් අවස්ථාවක අවලංගු කොට ඇත්තේ ද?
*(ආ)* ඉහත ප්‍රශ්නයට පිළිතුර ඔව් නම්, කවර වතාවක් එසේ අවලංගුකොට ඇත්තේ ද යන්න සහ එසේ අවලංගු කිරීමට හේතු ?

........................................................................................................
........................................................................................................
........................................................................................................

මෙම ඉල්ලුම්පත්‍රයේ මා විසින් ඉදිරිපත් කර ඇති සියලු තොරතුරු සත්‍ය සහ නිවැරදි බව මා මෙයින් ප්‍රකාශ කර සිටිමි.

| ......................................... | ......................................... | ......................................... |
|---|---|---|
| දිනය | ඉල්ලුම්කරුගේ අත්සන | ප්‍රතිකාර මධ්‍යස්ථානයේ රබර් මුද්‍රාව |

***කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි.*** ලැබුණු දිනයඃ ------------------------------

ප්‍රතිකාර මධ්‍යස්ථානය පරීක්ෂා කිරීම සඳහා NDDCB හි,
අධ්‍යක්ෂ (ප්‍රතිකාර) බලය පවරනු ලබන නිලධරයාගේ අදහස්.

------------------------------ ------------------------------
අත්සන දිනය

NDDCB හි අධ්‍යක්ෂ (ප්‍රතිකාර) ගේ නිර්දේශ.

------------------------------ ------------------------------
අත්සන දිනය

අනුමත කරන ලදී/නොකරන ලදී.

------------------------------ ------------------------------
NDDCB හි සභාපතිවරයාගේ අත්සන දිනය

**පෝරම අංක 2**

වෙත,
ජාතික අන්තරාදායක ඖෂධ පාලක මණ්ඩලය,
අංක 383, කෝට්ටේ පාර,
රාජගිරිය.

2007 අංක 54 දරන ඖෂධවලට ඇබ්බැහි තැනැත්තන් (ප්‍රතිකාර හා පුනරුත්ථාපනය) පිළිබඳ පනත.
බලපත්‍රයක් අලුත් කර ගැනීම සඳහා ඉල්ලුම්පත්‍රය

ඉල්ලුම්කරුගේ විස්තර

1. ඉල්ලුම්කරුගේ නම : ..................................................................................
..................................................................................

2. ඉල්ලුම්කරුගේ ලිපිනය : ..................................................................................
..................................................................................
..................................................................................

3. ජාතික හැඳුනුම්පත් අංකය : ..................................................................................
ව්‍යාපාර ලියාපදිංචි අංකයඃ/N(Pvc) අංකය : ..................................................................................

4. දුරකථන අංකය : ..................................................................................

5. ෆැක්ස් අංකය : ..................................................................................

6. ඊ-තැපැල : ..................................................................................

7. ප්‍රතිකාර මධ්‍යස්ථානයට පළමු වතාවට බලපත්‍රයක් නිකුත් කළ දිනය

| | | |
|---|---|---|
| දිනය | මාසය | වර්ෂය |

8. අවසන් කාලය තුළ ප්‍රතිකාර මධ්‍යස්ථානයෙන් ප්‍රතිකාර ලැබූ ඖෂධවලට ඇබ්බැහි තැනැත්තන් සංඛ්‍යාව.

9. අවසන් කාලය තුළ ඖෂධවලට ඇබ්බැහි තැනැත්තන්ගෙන් ඖෂධවලින් මිදුණු තැනැත්තන් සංඛ්‍යාව.

10.*(අ)* ප්‍රතිකාර මධ්‍යස්ථානයට නිකුත් කරන ලද බලපත්‍රයක් NDDCB මගින් යම් අවස්ථාවක අවලංගු කොට ඇත්තේ ද

☐

*(ආ)* ඉහත ප්‍රශ්නයට ‘‘ඔව්’’ යන්නෙන් පිළිතුරු සපයා ඇත්නම්, එසේ අවලංගු කරන ලද වාර ගණන සහ ඒ සඳහා හේතු :-

☐

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

11. පනතේ යම් විධිවිධානයක්, හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් කඩකිරීම හෝ උල්ලංඝනය කිරීම හෝ NDDCB මගින් දෙන ලද යම් නියමයක් හෝ නියෝගයක් හෝ බලපත්‍රයේ සඳහන් යම් නියමයක් හෝ කොන්දේසියක් කඩ කිරීම සඳහා NDDCB මගින් ප්‍රතිකාර මධ්‍යස්ථානයට අවවාද කර ඇද්ද යන්න

☐

12. ඉහත ප්‍රශ්නයට ‘‘ඔව්’’ යන්නෙන් පිළිතුරු සපයා ඇත්නම්, එසේ අවවාද කර ඇති වාර ගණන සහ ඒ සඳහා හේතු:-

☐

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

13. ප්‍රතිකාර මධ්‍යස්ථානයේ භෞතික යටිතල පහසුකම්, කාර්ය මණ්ඩලය, ප්‍රතිකාර වැඩසටහන් හෝ කළමනාකරණය සම්බන්ධයෙන් වර්තමාන අවස්ථාවේ සහ පළමු වතාවට බලපත්‍රයක් ලබාගත් අවස්ථාව අතර යම් වෙනස්කම් තිබේ ද යන්න.

☐

14. ඉහත ප්‍රශ්නයට ඔව් යන්නෙන් පිළිතුරු සපයා ඇත්නම්, එම වෙනස්කම් සඳහන් කරන්න.

.................................................................................................................................

.................................................................................................................................

මෙම ඉල්ලුම්පත්‍රයේ මා විසින් ඉදිරිපත් කර ඇති සියලු තොරතුරු සත්‍ය සහ නිවැරදි බව මා මෙයින් ප්‍රකාශ කර සිටිමි.

.................................................................................................................................

.................................................................................................................................

| ........................................ | ........................................ | ........................................ |
| --- | --- | --- |
| දිනය | ඉල්ලුම්කරුගේ අත්සන | ප්‍රතිකාර මධ්‍යස්ථානයේ රබර් මුද්‍රාව |

***කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි.*** ලැබුණු දිනය: ------------------------------

NDDCB හි, අධ්‍යක්ෂ (ප්‍රතිකාර) බලය පවරන ලද නිලධරයාගේ විස්තර ප්‍රකාශය.

| | |
|---|---|
| ------------------------------ | ------------------------------ |
| අත්සන | දිනය |

NDDCB හි අධ්‍යක්ෂ (ප්‍රතිකාර) ගේ නිර්දේශය.

| | |
|---|---|
| ------------------------------ | ------------------------------ |
| අත්සන | දිනය |

අනුමත කරමි/නොකරමි.

| | |
|---|---|
| ------------------------------ | ------------------------------ |
| NDDCB හි සභාපතිගේ අත්සන | දිනය |

05 - 677/ 2

එල්. ඩී. බී. 12/2008

**2007 අංක 54 දරන ඖෂධවලට ඇබ්බැහි තැනැත්තන් (ප්‍රතිකාර හා පුනරුත්ථාපනය) පිළිබඳ පනත**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන ව්‍යවස්ථාවේ (2) වන ඡේදය සමග කියවිය යුතු, 2007 අංක 54 දරන ඖෂධවලට ඇබ්බැහි තැනැත්තන් (ප්‍රතිකාර සහ පුනරුත්ථාපනය) පිළිබඳ පනතේ 7 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදනු ලබන නියෝග.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති.

2010 මැයි මස 04 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මෙම නියෝග, 2010 අංක 02 දරන ප්‍රතිකාර මධ්‍යස්ථාන (තුලනීක්ෂණ මූල මණ්ඩල) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (1) මේ නියෝගවල කාර්ය සඳහා, තුලනීක්ෂණ මූල මණ්ඩලවල සාමාජිකයන් ලෙස සේවය කිරීම සඳහා, අමාත්‍යවරයා විසින් නීති ක්ෂේත්‍රයේ යෝග්‍ය සුදුසුකම් හා පළපුරුද්ද ඇති තැනැත්තන් හෝ අන්තරායදායක ඖෂධ ඇබ්බැහිය හා සම්බන්ධ කායික විද්‍යාත්මක හෝ සමාජ ගැටළු යන අංශ පිළිබඳ පළපුරුද්දක් හෝ දැනීමක් සහිත තැනැත්තන් අතුරින් දහ දෙනෙකුට නොවැඩි තැනැත්තන් සංඛ්‍යාවක් හඳුනාගෙන පත්කරනු ලැබිය යුතු ය.

(2) මේ නියෝගවල කාර්ය සඳහා, අවශ්‍ය වූ විට, NDDCB මගින් අමාත්‍යවරයා විසින් පත්කරනු ලැබූ තැනැත්තන් අතරින් තුන් දෙනෙකුට නොවැඩි තැනැත්තන් සංඛ්‍යාවකින් සමන්විත මූල මණ්ඩල, තුලනීක්ෂණ මූල මණ්ඩලයක් ලෙස කටයුතු කිරීම සඳහා පිහිටුවා නම් කරනු ලැබිය යුතු ය.

3. (1) 2 වන නියෝගය යටතේ පිහිටුවා නම් කරනු ලබන යම් තුලනීක්ෂණ මූල මණ්ඩලයක කර්තව්‍ය පහත පරිදි විය යුතු ය:

*(අ)* 2007 අංක 54 දරන ඖෂධවලට ඇබ්බැහි තැනැත්තන් (ප්‍රතිකාර හා පුනරුත්ථාපනය) පිළිබඳ පනත යටතේ බලපත්‍ර ලබා දී ඇති හෝ තාමෝද්දිශ්‍ය යම් ප්‍රතිකාර මධ්‍යස්ථානයකට (මෙහි මින්මතු "ප්‍රතිකාර මධ්‍යස්ථානය" යනුවෙන් හඳුන්වනු ලබන) ඇතුළත් වීමට ඉදිරිපත් වන තැනැත්තන්ගේ ඖෂධවලට ඇබ්බැහි වී ඇති මට්ටම තක්සේරු කිරීම;

*(ආ)* යම් ප්‍රතිකාර මධ්‍යස්ථානයකට ඇතුළත් වීමට ඉදිරිපත් වන තැනැත්තන්ගේ ඖෂධ පාවිච්චිය සඳහා ඇති පෙළඹීමේ මට්ටම තක්සේරු කිරීම;

*(ඇ)* යම් ප්‍රතිකාර මධ්‍යස්ථානයකට ඇතුළත් වීමට ඉදිරිපත් වන තැනැත්තන්ගේ ශාරීරික සහ මානසික සෞඛ්‍ය තත්ත්වය තක්සේරු කිරීම ;

*(ඈ)* යම් ප්‍රතිකාර මධ්‍යස්ථානයකට ඇතුළත් වීමට ඉදිරිපත් වන තැනැත්තන්ගේ පවුල් පසුබිම සොයා බැලීම;

*(ඉ)* ප්‍රතිකාර මධ්‍යස්ථානවල ප්‍රතිකාර ලබන තැනැත්තන්ගේ ඖෂධ භාවිතයට ඇති ලැදියාවේ මට්ටම, ඔවුන්ගේ චර්යා වෙනස්කම්, පවුලේ අනෙකුත් සාමාජිකයන් සමග ඔවුන්ගේ ඇති සබඳතා වැඩිදියුණු වීම සහ ඔවුන් සමාජය කෙරෙහි දරනු ලබන ආකල්ප තක්සේරු කිරීම;

*(ඊ)* යම් තැනැත්තකු ප්‍රතිකාර මධ්‍යස්ථානවලට ඇතුළත් කිරීම සඳහා යම් ප්‍රතිකාර මධ්‍යස්ථානයක අධ්‍යක්ෂවරයා වෙත නිර්දේශ කිරීම;

*(උ)* ප්‍රතිකාර මධ්‍යස්ථානවලින් ප්‍රතිකාර ලබන තැනැත්තන්ගේ තත්ත්වය පිළිබඳව යම් ප්‍රතිකාර මධ්‍යස්ථානයක අධ්‍යක්ෂවරයාට විධිමත් ලෙස වාර්තා කිරීම;

*(ඌ)* ප්‍රතිකාර මධ්‍යස්ථාන මගින් පවත්වනු ලබන ඉදිරි කටයුතු කරගෙන යෑමේ වැඩසටහන්වලට අදාළව පවත්වාගෙන යනු ලබන වාර්තා පරීක්ෂා කිරීම සහ එම වැඩසටහන්වල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා NDDCB වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම ;

*(එ)* නවාතැන් ගෙන ප්‍රතිකාර ලබන යම් තැනැත්තකු මුදා හැරීම සඳහා සම්පූර්ණ කළ යුතු යයි NDDCB මගින් දක්වා ඇති උපමාන සම්පූර්ණ කරනු ලබන යම් තැනැත්තකු මුදා හැරීම සඳහා NDDCB වෙත නිර්දේශ කිරීම.

(2) NDDCB මගින් පිහිටුවනු ලැබ නම් කරනු ලැබූ යම් තුලනීක්ෂණ මූල මණ්ඩලයක්, NDDCB මගින් එම මූල මණ්ඩලය වෙත පවරන ලද කර්තව්‍ය ඉටුකොට අවසාන වූ පසු එම මූල මණ්ඩලය පිහිටුවීමේ දින සිට සති තුනක් ඇතුළත හෝ එම මූල මණ්ඩලය පිහිටුවන අවස්ථාවේ දී NDDCB මගින් නිශ්චිතව දක්වනු ලබන වෙනත් යම් කාලසීමාවක් තුළ දී එම කාරණය පිළිබඳ සිය නිරීක්ෂණ සහ නිර්දේශ හෝ යම් වාර්තාවක් NDDCB වෙත ඉදිරිපත් කළ යුතු ය.

4. තුලනීක්ෂණ මූල මණ්ඩලයක සෑම සාමාජිකයකුටම -

*(අ)* පූර්ව දැනුම් දීමකින් පසුව, යම් ප්‍රතිකාර මධ්‍යස්ථානයකට දවසේ සෑම සාධාරණ වේලාවක දී ම ඇතුළු වීමට;

*(ආ)* යම් ප්‍රතිකාර මධ්‍යස්ථානයකට ඇතුළත් වීමට ඉදිරිපත් වන යම් තැනැත්තකු හෝ එවැනි යම් මධ්‍යස්ථානයක නවාතැන්ගෙන ප්‍රතිකාර ලබන යම් තැනැත්තකු පරීක්ෂා කිරීමට;

*(ඇ)* යම් ප්‍රතිකාර මධ්‍යස්ථානයකට ඇතුළත් වීමට ඉදිරිපත් වන යම් තැනැත්තකුගේ හෝ එවැනි යම් ප්‍රතිකාර මධ්‍යස්ථානයක නවාතැන් ගෙන ප්‍රතිකාර ලබන යම් තැනැත්තකුගේ පවුලේ සාමාජිකයන් සමග සාකච්ඡා කිරීමට සහ එවැනි යම් තැනැත්තකුගේ වෛද්‍ය වාර්තා හෝ වෙනත් යම් ලේඛන පරීක්ෂා කිරීමට ;

*(ඈ)* යම් ප්‍රතිකාර මධ්‍යස්ථානයක පවත්වාගෙන යනු ලබන යම් වාර්තා හෝ වෙනත් ලේඛන පරීක්ෂා කිරීමට; බලය තිබිය යුතු ය.

5. 2 වන නියෝගය යටතේ පත්කළ සෑම සාමාජිකයකුම, මරණය, ඉල්ලා අස්වීම හෝ ඉවත් කිරීම හේතුවෙන් සිය ධූරය හිස් කරන්නේ නම් මිස, ඔහුගේ පත්වීමේ දින සිට අවුරුදු තුනක කාලයක් සඳහා ධූර දැරිය යුතු ය. තව ද, ඔහු ඉවත් කරනු ලැබුවේ නම් මිස නැවත පත් කරනු ලැබීමට සුදුසු විය යුතු ය.

එසේ වුව ද, කිසිම සාමාජිකයකු වාර දෙකකට වඩා වැඩි ගණනක් නැවත පත් කරනු නොලැබිය යුතු ය.

6. NDDCB මගින් පිහිටුවනු ලබන තුලනීක්ෂණ මූල මණ්ඩල, පවරනු ලබන නිශ්චිත කර්තව්‍ය, NDDCB සෑහීමට පත් වන පරිදි ඉටු කර අවසාන වූ පසු, එම මූල මණ්ඩලවලට පැවැත්ම අවසන් විය යුතු ය.

05-677/3

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.